

## Unborn Poems

They linger over
on new born rainbows,
hover around the windows
in the early morning hours.
They float on the river
when the moon smiles
on full moon days.
When the birds sing
outside my window
they bring a melody
of an unborn rhythm.
When the spring flowers are born
they paint images
of an unborn verse.
When I look at the darkness
in the middle of the night
they come one by one
as I breathe like a child
scared of the darkness.

**Sunil Govinnage**

## මගේ පුතා

කාශ්ටක අව් රශ්මිය
සිනිඳු කිරි සිරුර දවන
නගර මැද කාණු අතර
සිහින මාලිග තනන
අකුරු කරන දරු කැළ දෙස
බලා සුසුම් ළයට ගන්න
වීදි කොණක මගෙ යුව රජ
කිළිටි පොරව දසත දුවන

පයිප්පයේ මලකඩ කෑ
කරාමයට මුව තියාන
තුන් වේළට කුස පිරෙන්න
රජ බොජු ලෙස භුක්ති විඳින
ටයි පටි ලා ගමන් කරන
මහ ඇත්තන්ගෙන් ටොකු කන
මගේ පුංචි පුත් කුමරා
හෙට රජ වන්නට සුදුසුද

දයාබරව ළඟට ගන්න
මගේ පුතා පුංචි වැඩිද
පුතේ කියා අමතන්නට
ලෝකෙ උන්ගෙ කටේ ගෙඩිද
කාළකණ්ණි අපේ පවට
මගේ එකා කල වරද කිමද
පොඩි එකෙක්ට සෙනෙහෙ දෙන්න
අපෙ උගතුන් උගත් වැඩිද??

**-සිතිජ -**

රෝහිත සෙනෙවිරත්න

## සත්‍ය ප්‍රේමය

නොලැබෙනා මිරිඟුවක්
නිසා නොදකින සිතක්
දමා දුර තව තවත්
ඇදුනු පසු උව බිඳක්

හැරී බැලුවොත් මඳක්
ළඟින් ඇත සෙනෙහසින්
තව තවත් ළං වෙමින්
පැතුම් පොඩි පොදි බැඳන්

හැරෙනු හැකි නම් යළිත්
සත්‍ය පෙම ඇත ළඟින්
පුදම් හද පුදසුනම
වටී ඔබ ඒ තරම්

## නොලියූ කවිය

කොතෙකුත් තැත් කලද
කවියට නගන්නට
මා සිතින් මිදී යන
නොලියූ කවිය

පිණි වැටුණු උදෑසන
තණ පතක් අග රැඳුණ
පිණි බිඳක සැඟව ගත්
නොලියූ කවිය

සැඳෑ කල අහස් කුස
නෙක පැහැ රඳවමින්
හිරු සමඟ සැඟව යන
නොලියූ කවිය

තාරකා දෙනෙත් තුළ
සැඟවී ඉඟි කරන
නෙත් කැළුම් අග රැඳුණ
නොලියූ කවිය

ලියූ කවි දහසින්ම
නොකිය වී සැඟව ගිය
මිහිරිතම රස සැඟව
නොලියූ කවිය

**අනුෂ්ක තිලකරත්න**

# මනුස්සකම උතුරා ගිය නිහඬ සිත්තරා....

**- ජයන්ත ගෝමස්**













මෙවර සන්නස කවරය සැරසෙනුයේ ජයන්ත ගෝමස් නම් කලාකරුවාගේ තෙලිතුඩගින් නිම වූ සිතුවමකිනි. සම්ප්‍රදායානුකූල බෞද්ධ සිතුවම් වෙනුවට බොදු සිතුවම් ඔහු අතින් මැවෙනුයේ බොහෝ විට අප කිසිවෙක් නොදකින සාහිත මානයකිනි. ඔහු ඒවාට අපූරු අර්ථකතනයන්ද සපයයි.

වසර 1956 දී සිව්දරු පවුලක තුන්වැන්නාව උපත ලද ජයන්ත, කුඩා කලදීම තම පියාගේ වියෝවෙන් කම්පනයට පත් වෙයි. පවුලක මුදුන් මුල වන් පියකු - ගේ අභාවයෙන් තරුණ කොළුවකුගේ සිතෙහි කුමන නම් හැඟීම් පහළ වේවිද? දුක්තැවුල්, පරාජයන් හමුවේ තාරුණ්‍යයට පිවිසෙමින් සිටින ඔහු පවුලේ ආර්ථික පසුබිම සකසා ගනු වස් තමා සතු කලාත්මක හැකියාව ප්‍රයෝජනයට ගනී. තමා තුළ සැඟව ඇති නිර්මාණශීලී හැකියාව ඉවෙන් මෙන් වටහා ගන්නා ඔහු බතික් සිතුවමෙහි යෙදෙන්නේය.

චිත්‍ර ශිල්පියෙකු ලෙසින් ජීවිතය ජය ගත් ජයන්තයන්, පසුකලෙක විදේශගත වනුයේ තම ජීවිත සහකාරිය හමුවන්නටම විය යුතුය.

1992 වන විටදී ලේඛකයෙකු ලෙසින් "ඉබ්බා'' නමින් ළමා කතාවක් මුද්‍රණය කරයි. එය ජර්මන් බසින්ද ලියැවීම සහ ඔහුගේ ළමා සිතුවම් ද විදේශීය සාහිත්‍යය වෙත ශ්‍රී ලාංකීය සාහිත්‍යය ගෙන යෑමේ උත්සාහයක් යැයි ද මට සිතේ. ළමා සිත් පහන් කරන මනහර සිතුවම් වලින් ඒ පොත් පිංච නිමවා ඇත.

2000 වසර වන විට දී ඔහු තම ප්‍රථම නව කතාව ගොතනුයේ වසර 30කට පමණ පෙර ශ්‍රී ලංකාවේ පැවැති භීෂණ සමයක අඳුරු සෙවනැලි ද, මතකයන් ද එක් කර, කිසිවෙක් නොදුටු තරුණ පාසල් සිසුවකුගේ ඇසිනි. එය "කළුවර අරුණ'' නම් කෘතියයි. තරුණ දරුවන්ගේ ආවේගශීලී සහ හැඟීම්බර සිතුවිළි ද, ඒ ඉදිරියේ දෙමව්පියන් අසරණ වන අයුරු ද, දරුණු යයි සම්මත සමහර රාජ්‍ය නිළධාරීන්ගේ සැඟවුණු මානුෂික ගුණාංගයන්ද කතා කරන්නට ඔහු තෝතැන්නක් කර ගත්තා වැනිය.

"කළුවර අරුණ'' "සමගියේ සිහිනය'' සහ තවත් ජර්මන්, ඉංග්‍රීසි භාෂා වලට ලියන ලද පොත් ද වෙයි. දිගින් දිගටම චිත්‍ර ශිල්පයෙහිත්, ලේඛනයෙහිත් යෙදෙන ජයන්තයන් මේ වන විට චිත්‍ර ප්‍රදර්ශන ගණනාවක්ම ජර්මනිය ඇතුළු යුරෝපයේත්, අනෙකුත් රටවලත් පවත්වා ඇති අතර ඔහු ඉතා නිතහමානී, නිහඬ දිවි පෙවෙතක් ගෙවමින් ජර්මනිය වාසභූමි කොට සිටී.

සැබෑ මානව හිතවාදියෙකු, කලා කරුවකු ලෙසින් සැබැවින්ම ඔහු නිහඬව ලොවට යමක් පරිත්‍යාග කරමින් මෙහෙවරක යෙදෙයි. මනුස්සකම සැබෑ කලාකරුවකු කෙරෙන් උතුරා යන හිතවත්කම, නොව අපේ අත්දකින්නට ලැබුණු බව කියාපෑම ද අතිශයෝක්තියක් වාසනාවය..

සිත පුරා නැගෙන සිතුවිලි .. තෙලිතුඩගෙන්, පන්හිඳෙන් කියන්නට පමණක් නොව ඔහු අපූරු කතිකයෙක් ද වෙයි. ඉතා දක්ෂ දේශකයෙකු ලෙස විවිධ අභිනයෙන් සහ කතා විලාසයෙන් ඔහු ඔබ මොනවට සංවේදී කරයි.

මේ මහා කලාකරුවාට සන්නසෙහි අපි සුබ පතමු.

තිසර FM 97.4

FM 97.4

සෙනසුරාදා පව 1 සිට 5 දක්වා
ඔබට පිදෙන සාර සංග්‍රහය

ශ්‍රී ලාංකික ඔබේ රියදුරු පාසල

Ravin රවින්
Professional / Patient Instructor
Easy Learning Techniques
Exceptional Pass Rate

Iyoka Driving School
Training Excellence

Tel : 94021196
Mobile : 0433028029
iyoka_ds@yahoo.com.au